රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2001

මගේ අංකය: ආ/1/4/4/2
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා,
පළාත් පාලන සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2001.10.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## <u>රාජ්‍ය සේවකයින්ට සහ විශ්‍රාමිකයින්ට අතුරු දීමනාවක් ගෙවීම</u>

2001 ඔක්තෝබර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියළුම රාජ්‍ය සේවකයින්ට විශ්‍රාම වැටුප් සඳහා ගණනය නොකෙරෙන රුපියල් 1200/- ක මාසික අතුරු දීමනාවක් ගෙවීමට රජය තීරණය කර ඇත. මෙම දීමනාව 2000 සැප්තැම්බර් 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2000 න් ලබාදී ඇති අතුරු දීමනාවට අමතරව වේ.

02. දෛනික වැටුප් ලබන සේවකයින්ටද වැඩ කරන දිනකට රු. 57.14 ක දීමනාවක්, මසකට දින 21 ක උපරිමයක් දක්වා ගෙවිය යුතුය.

03. සියළුම විශ්‍රාමිකයින් සඳහාද රු. 750/- ක මාසික අතුරු දිමනාවක් 2001 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවිය යුතුය. මෙම දීමනාව 2000 සැප්තැම්බර් 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2000 මඟින් ලබා දී ඇති අතුරු දීමනාවට අමතරව වේ.

04. ඉහත සඳහන් අතුරු දීමනා වැටුප් කොමිෂන් සභාවේ සහ විශ්‍රාම වැටුප් පිළිබඳ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක වන තෙක් බලපවත්වනු ඇත.

05. 2001 වර්ෂයේ ඉතිරි කාල පරිච්ඡේදය වෙනුවෙන් මෙම අතුරු දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ඕනෑම පුනරාවර්තන වැය විෂයයක් යටතේ ඇති ඉතිරි කිරීම් වලින් හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව වැය විෂයය 1906 යටතේ සලසා ඇති ප්‍රතිපාදන මාරුකිරීම් මඟින් හෝ සලසා ගත යුතුය. මේ අනුව සලසාගත හැකි අරමුදල් ප්‍රමාණවත් නොවුවහොත් අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන ලබාදීමට මහා භාණ්ඩාගාරය විසින් කටයුතු කරනු ඇත.

06. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

**එම්.එන්.ජුනයිඩ්**
**ලේකම්**
**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය**